විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය    தலைமுறையொன்றின் பெருமிதம்    Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. විවැ/උපදෙස් ලිපි අංක 02/2016    ඔබේ අංකය / உமது இல. / Your No. ........................    දිනය / திகதி / Date 2016-01-12

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**6/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව විශ්‍රාම වැටුප් ගැලපීම**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/2015 අනුව විශ්‍රාම වැටුප් ගැලපීමේ කටයුතු 2015 අගෝස්තු මස ආරම්භ කර මේ වන විට 95% කගේ පමණවැටුප් ගැලපීම් කටයුතු අවසන් කර ඇත. මෙම විශ්‍රාම වැටුප් ගැලපීමේ කටයුතු දෙපාර්තමේන්තුව මගින් හඳුන්වාදුන් විශේෂිත පරිගණක වැඩසටහන් මගින් ජාලගත පද්ධතියක් මගින් ඉටු කරන ලදී. එම කටයුතු ඉටු කිරීමේදී ඔබ සහ ඔබගේ කාර්යය මණ්ඩලය ලබාදුන් සහයෝගය ඉතා අගය කොට සලකමි.

02. මෙම වැටුප් ගැලපීම සිදුකිරීමේදී ඒ සඳහා අනුගමනය කල යුතු ක්‍රියාවලිය සම්බන්ධයෙන් මාගේ අංක 5/2015 චක්‍රලේඛය මගින් උපදෙස් නිකුත් කරන ලදී.

03. මෙම ක්‍රියාවලිය කඩිනමව නිම කිරීම සඳහා දෙපාර්තමේන්තුව මගින් හඳුන්වාදුන් විශේෂිත පරිගණක වැඩ සටහන දත්ත ඇතුළත් කිරීම අදාළ විෂයභාර විශ්‍රාම වැටුප් නිලධාරී හෝ සංවර්ධන නිලධාරී විසින් සිදු කළ යුතුව තිබුණි. එම දත්ත නිර්දේශ කිරීම (Recommend) ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ගණකාධිකාරී විසින් සිදුකල යුතු බව මවිසින් උපදෙස් නිකුත් කර ඇත. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ගණකාධිකාරීවරු විසින් මෙම වැටුප් පරිවර්තනයන් සඳහා නිර්දේශ ලබාදී ඇති අතර තවදුරටත්, නිර්දේශ නොකළ වැටුප් පරිවර්තනයන් ඇති බව නිරීක්ශණය වේ.

04. මෙම වැටුප් පරිවර්තනයන් වල නිවැරදි භාවය තහවුරු කර නිර්දේශ කිරීම අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ගණකාධිකාරීවරුන්ගේ වගකීම් බැවින්, නොපමාව අදාළ නිර්දේශයන් සිදුකරන මෙන් උපදෙස් නිකුත් කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

එස්.එස්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:-

01. ලේකම් - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
02. ලේකම් - මුදල් අමාත්‍යාංශය
03. ලේකම් - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
04. විගණකාධිපති - අ.ක.ස.

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය தலைமுறையொன்றின் பெருமிதம் Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. විවැ/උපදෙස් ලිපි අංක 01/2016 ඔබේ අංකය / உமது இல. / Your No. ........................ දිනය / திகதி / Date 2016-01- 12

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

<u>මධ්‍යගත දත්ත පද්ධතියේ කටයුතු යාවත් කාලීන කිරීම</u>

මාසික විශ්‍රාම වැටුප් ගෙවීම කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා මේ වන විට මධ්‍යගත දත්ත පද්ධතිය මඟින් ගෙවීම් කටයුතු සිදු කරනු ලබයි. ඒ අනුව තවදුරටත් ගෙවීම් කටයුතු නිරවුල් ලෙස ඉටු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

**2. අවකරණ සම්බන්ධව කටයුතු කිරීම.**

අවකරණ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කටයුතු කල යුතු ආකාරය සම්බන්ධයෙන් මාගේ අංක PN/CA/2015/1 සහ 15/09/10 දිනැති ලිපියෙන් ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු කල යුතුය. විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් නැවත අයකර ගැනීම (Surcharge), වැන්දඹු අනත්දරු අයකර ගැනීම (W&OP) සහ අයනොවූ පාරිතෝෂික විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීම් සෘජුවම දෙපාර්තමේන්තුව මඟින් 2015 නොවැම්බර් මස සිට අයකර ගැනීමට කටයුතු කරන බැවින්, ඉහත කරුණු සම්බන්ධව නව අයකිරීම් ඔබ විසින් දත්ත පද්ධතියට ඇතුළත් නොකළ යුතුය. ඒ සම්බන්ධයෙන් පහත කටයුතු කිරීම අවශ්‍යවේ.

අ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දැනටමත් ඉහත අයකිරීම් සඳහා දත්ත පද්ධතියට ඇතුළත් කර ඇති තොරතුරු එලෙසම පවත්වා ගෙන යාම.

ආ. යම් විශ්‍රාමිකයෙකුගෙන් රජයට අයවිය යුතු අයවීම් සම්බන්ධව ඔබ වෙත වාර්තා වූ වහාම එම තොරතුරු අයකිරීම සඳහා නොපමාව දෙපාර්තමේන්තුවට යොමු කිරීම.

ඇ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ඇතුළත් කර ඇති තොරතුරු අනුව මාසික අයකිරීම සහ දෙපාර්තමේන්තුව සෘජුව ඇතුළත් කරන තොරතුරු පිළිබඳ මාසික අයවීම් මධ්‍යගත දත්ත පද්ධතිය මඟින් වෙන් වෙන්ව හඳුනාගත හැකි ලෙස සකසා ඇති බැවින්, ඒ අනුව අයකිරීම් වල නිවැරදිතාවය තහවුරු කර ගැනීම.

ඈ. මෙහි දක්වා ඇති අවකරණ සම්බන්ධයෙන් මාසික ගිණුම් සාරාංශය මඟින් ගිණුම් ගත කිරීම (දෙපාර්තමේන්තුවේ සෘජු අවකරණ සහ ප්‍රාලේ අවකරණ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු නොකළ යුතුය.

ඉ. අනෙකුත් අඩු කිරීම් සම්බන්ධයෙන් 2015/09/10 දින අංක Pen/CA/2015/01 ලිපියේ සඳහන් උපදෙස් පරිදි කටයුතු කල යුතුය.

මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.

## 3. පාලන ගිණුම් පවත්වාගෙන යාම

දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් මට්ටමෙන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් පාලන ගිණුම් මාසිකව සකසා මධ්‍යගත දත්ත පද්ධතියේ පෙන්නුම් කර ඇත. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ද පාලන ගිණුම් සැකසිය යුතු අතර, දෙපාර්තමේන්තු පාලන ගිණුම් සමඟ මාසිකව සංසන්දනය කර නිවැරදිතාවය තහවුරු කර ගත යුතුය.

## 4. දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා අක් මුදල් නිදහස් කිරීම

මාසිකව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා නිදහස් කළ යුතු අක් මුදල් ප්‍රමාණය, ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා නිදහස් කළ යුතු අක් මුදල් ප්‍රමාණය අනුව දත්ත පද්ධතියට දෙපාර්තමේන්තුව මඟින් යොමු කරනු ලබයි. ඒ අනුව භාණ්ඩාගාරය වෙතින් අක් මුදල් නිදහස් කරනු ඇත.

එස්.එස්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

01. ලේකම් - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

02. ලේකම් - මුදල් අමාත්‍යාංශය